# ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

# ජාතික යොවුන් සේනාංකය

# ඇබෑර්තු

ජාතික යොවුන් සේනාංකයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. ජාල පරිපාලක (JM 1-1)

මෙම තනතුර ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට දායකත්වය හිමිය.

මෙම තනතුර සඳහා අයදුම් කරනු ලබන සෑම අයදුම්කරුවෙකුම,

අ. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

ආ. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

ඇ. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

**01. ජාල පරිපාලක (JM 1-1) - මුලස්ථානය සඳහා**

**අ. අධ්‍යාපන සුදුසුකම් :** බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2 හෝ 3 හෝ 4)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිගණක ඉංජිනේරු, පරිගණක විද්‍යා, තොරතුරු තාක්ෂණ, පරිගණක විද්‍යා හා තාක්ෂණ, පරිගණක විද්‍යා උපාධියක් ලබා තිබීම.

2. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන පරිගණක විද්‍යා සහ තොරතුරු තාක්ෂණ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

3. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන පරිගණක විද්‍යා සහ තොරතුරු තාක්ෂණ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. **සහ**

   සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

4. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන පරිගණක විද්‍යා සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. **සහ**

   සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**වයස** : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් ක්‍රමය** : JM1-1 - 2/2016 රු.42,600-10X755-18X1,135 = රු.70,580 මීට අමතරව රජයේ අනෙකුත් අනුමත දීමනා ගෙවනු ලැබේ.

මෙම තනතුරු සඳහා අයදුම්කරන්නන් සුදුසු ආකෘතියක් අනුව ඉල්ලුම්පත්‍රයක් පිළියෙල කොට ඉල්ලුම්පත එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කර අදාළ සහතිකවල ඡායා පිටපත් සමගින් 2023.12.12 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් අයදුම්පත් යොමු කළයුතු වේ.

අසම්පූර්ණ, අදාළ සුදුසුකම් සපුරා නොමැති හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අධ්‍යක්ෂ, ජාතික යොවුන් සේනාංකය,**<br>
**අංක 420, බෞද්ධාලෝක මාවත,**<br>
**කොළඹ 07.**

**අධ්‍යක්ෂ**<br>
**ජාතික යොවුන් සේනාංකය**